දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය -2020 (පුනර් 2016) - 2022 පෙබරවාරි / මාර්තු
First Examination in Arts (External) - 2020 (Repeat 2016) – February / March 2022

# ආවිප්‍ර 1.2 - ආර්ථික සංවර්ධනයේ ඉතිහාසය
# EC 1.2 – History of Economic Development

කාලය පැය (03)තුනයි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න

---

01. i. එංගලන්ත වැඩවසම් ක්‍රමයේ මූලික ලක්ෂණ අවධාරණය කරමින් එවකට එහි පැවති සමාජ - ආර්ථික වටපිටාව පිළිබඳව විචාරාත්මක විග්‍රහයක් කරන්න.

(ලකුණු 10)

ii. එංගලන්තයේ වැඩවසම් ක්‍රමයේ පරිහානියට බලපෑ සාධක පිළිබඳ විමර්ශනයක් කරන්න.

(ලකුණු 10)

02. i. 18 වන සියවසේ දී එංගලන්තයේ ඇති වූ කෘෂිකාර්මික විප්ලවය සම්බන්ධයෙන් දෙවැනි කොටු කිරීමේ ව්‍යාපාරය කවර ආකාරයේ බලපෑමක් ඇති කළේ ද යන්න පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ii. කෘෂිකාර්මික විප්ලවය මුල් වරට එංගලන්තය තුළම පැනනැගීමට බලපෑම් කරන ලද සාධක පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 10)

03. i. "18 වන සියවසේ දී එංගලන්තයේ ඇති වූ කාර්මික විප්ලවය මගින් යහපත් මෙන්ම අයහපත් ප්‍රතිවිපාක රැසක් ජනිත කරනු ලැබිණි". ප්‍රමාණවත් කරුණු ගෙන හැර දක්වමින් ඉහත ප්‍රකාශය විමර්ශනය කරන්න.

(ලකුණු 10)

ii. "එංගලන්ත කාර්මික විප්ලවය යනු ශිල්පීය ක්‍රම පිළිබඳ විප්ලවයකි". මෙම මතය පිළිබඳ ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

04. 19 වන සියවස අග භාගයේ දී එංගලන්තය තුළ රාජ්‍ය නිර්බාධවාදී ප්‍රතිපත්තිය පිරිහීයාමකට තුඩු දුන් පසුබිම විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

05. i. 1832 දක්වා දශක තුනක බ්‍රිතාන්‍ය පාලන සමය යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධව පුළුල් ප්‍රතිසංස්කරණ හඳුන්වා නොදීමට පදනම් වූ පසුබිම පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 10)

ii. බ්‍රිතාන්‍ය පාලන සමය යටතේ ශ්‍රී ලංකාවේ කෝල්බෲක් කැමරන් කොමිසම පත් කිරීමට පදනම් වූ පසුබිම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

06. i. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ හරහා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම මගින් ශ්‍රී ලංකාවේ නිදහස් ශ්‍රම වෙළෙඳපොළක් ගොඩ නගා ගැනීමට බ්‍රිතාන්‍යයන් විසින් ගනුලැබූ ප්‍රයත්නය කොතෙක් දුරට සාර්ථක වූයේ ද යන්න විචාරාත්මකව අගයන්න.

(ලකුණු 10)

ii. 1850 ගණන් වලින් පසු දශක දෙකක පමණ කාලසීමාවේ ශ්‍රී ලංකාවේ කෝපි වගාවේ සමෘද්ධිය සඳහා ඉවහල් වූ සාධක පිළිබඳ විග්‍රහයක් කරන්න.

(ලකුණු 10)

07. i. "1833න් පසු බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් නව ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන පිළිබඳ ඉතා වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කර ඇත". 1833 ට පෙර ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන පිළිබඳ පසුබිම ද සැලකිල්ලට ගනිමින් ඉහත ප්‍රකාශය පිළිබඳ ප්‍රමාණවත් කරුණු ගෙන හැර දක්වන්න.

(ලකුණු 10)

ii. 1840 ගණන් වලින් පසුව ශ්‍රී ලංකාවේ තේ වගාවේ ආරෝහණයට ඉවහල් වූ සාධක පිළිබඳව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

08. බ්‍රිතාන්‍ය පාලන සමය යටතේ ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය ආශ්‍රිත ප්‍රවනතා මොනවාද යන්න ප්‍රමාණාත්මක දත්ත ඇසුරින් විමර්ශනය කරන්න.

(ලකුණු 20)

*******************